කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13**

**(නව /පැරණි නිර්දේශය)**

**2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝල විද්‍යාව - GEOG- E 1025**

**මානුෂ භූගෝල විද්‍යාව**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 20 වන සියවසෙහි මානුෂ භූගෝලවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සිදුවූ වර්ධනය, භූගෝලවිද්‍යා විෂයෙහි අනන්‍යතාවයට සිදු කළ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. අ) ජූලියන් හක්සිලිගේ / සංස්කෘතිය පිළිබඳ ආකෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) ලෝකයේ සංස්කෘතික ප්‍රදේශ හඳුනා ගැනීමේ දී උක්ත ආකෘතියේ ඇති ව්‍යවහාරිකත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 15)

03. 'ජනසංඛ්‍යා සහ සංවර්ධනය' අතර පවතින සම්බන්ධතාව පිළිබඳව භූගෝල විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් වූ මතවාද පරීක්ෂා කරන්න. (ලකුණු 20)

04. "ගෝලීය ජනසංඛ්‍යා වර්ධනයේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහා නොටෙස්ටයින් ඉදිරිපත් කරන ලද ප්‍රජා විද්‍යා ක්‍රාන්තීය සංකල්පය ප්‍රායෝගික වැදගත් කමක් හිමිකර ගනියි" විමර්ශණය කරන්න. (ලකුණු 20)

05. අ) ස්වාභාවික සම්පත් සංරක්ෂණය යනු කුමක්ද ? (ලකුණු 05)

ආ) වර්තමාන ලෝක ප්‍රජාව පුනර්ජනනීය බලශක්ති භාවිතය කෙරේ යොමුවීමේ අවශ්‍යතාව, නිශ්චිත උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. තුන්වන ලොව රටවල අවිධිමත් නාගරීකරණය ආශ්‍රිත ගැටළු පරීක්ෂා කරන්න. (ලකුණු 20)

07. අ) අතිසාර සංවර්ධන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) ගෝලීය ප්‍රජාව ලෝක පාරිසරික සංරක්ෂණ ක්‍රමඋපායන් කරා යොමු වීමට ඉහත සංකල්පය තුළින් ඇති වූ දායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15)

08. මතු සඳහන් මාතෘකා අතරින් **දෙකකට (02)** කෙටි සටහන් සපයන්න.

අ) ආදිවාසී ජන සමාජ

ආ) හරිත විප්ලවීය තාක්‍ෂණය

ඇ) තෘතීය ආර්ථික ක්‍රියාකාරකම්

ඈ) ගෝලියකරණය

(ලකුණු 10 x 2 = 20)

*******************************